# සිසු පැවරුම්

(01) 1. දෙව ධර්ම දක්වන්න.
2. "සමග්ගා හොථ මා විවදථ" යන්නෙහි තේරුම දක්වන්න.
3. සරණංකර හිමි විසින් පිහිටුවා ගන්නා ලද සංවිධානය කුමක් ද?
4. දුටුගැමුණු රජු විසින් ඉදිකරවන ලද වෙහෙර විහාර දෙකක් නම් කරන්න.
5. අගසව් දෙනමගේ ගිහි කල නම් ලියන්න
6. පොළොන්නරු යුගයට අයත් චිත්‍ර දැකිය හැකි ස්ථාන දෙකක් දක්වන්න.
7. රජගහනුවර විසූ ෂඩ් ශාස්තෘවරයන්ගෙන් දෙදෙනෙක් දක්වන්න.
8. බුදු දහමේ දක්වෙන නොකළ යුතු වෙළඳාම්වලින් දෙකක් දක්වන්න.
9. සතර සතිපට්ඨානයෙන් දෙකක් දක්වන්න. (මුළු ලකුණු 20)
10. ආනන්තරිය පාපකර්මවලින් දෙකක් දක්වන්න.

(02) 1. තෙවන ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය හා එහි මූලිකත්වය ගෙන කටයුතු කළ අය දක්වන්න.
2. තෙවන ධර්ම සංගායනාවෙන් ලද ප්‍රතිඵල තුනක් දක්වන්න.
3. ශාසනයේ චිර පැවැත්මට හා ව්‍යාප්තියට තෙවන ධර්ම සංගායනාව ඉවහල් වූ ආකාරය විමසන්න. (මුළු ලකුණු 10)

(03) 1. කර්මය කෙටියෙන් හඳුන්වන්න.
2. කයින් සිදුවන අකුසල් තුනක් දක්වන්න.
3. බුදු බව හා රහත් බව ලැබුව ද පෙර කරන ලද පාපකර්මවලින් මිදිය නොහැක. උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (මුළු ලකුණු

(04) 1. "උට්ඨානවතෝ සතිමතෝ...." යන ගාථාව සම්පූර්ණ කරන්න.
2. එහි තේරුම දක්වන්න.
3. ජීවිතය සාර්ථක කරගැනීමට ධම්ම පදයෙන් ඔබට ලැබෙන උපදෙස් අගයන්න. (මුළු ලකු

(05) 1. වැලිවිට සරණංකර හිමි හැඳින්වූ වෙනත් නම් දෙකක් දක්වන්න.
2. සරණංකර හිමි විසින් රචිත ධර්ම ග්‍රන්ථ තුනක් දක්වන්න.
3. උන්වහන්සේගේ චරිතයෙන් ශිෂ්‍ය ජීවිතයට ලබාගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න. (මුළු ල

(06) 1. භාවනාව ප්‍රධාන කොටස් දෙකකි. ඒවා නම් කරන්න.
2. භාවනාවට පිවිසෙන පුද්ගලයෙකු විසින් ඉටුකරගත යුතු පූර්ව අවශ්‍යතා තුනක් දක්වන්න.
3. දෛනික ජීවිතයට භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න. (මුළු

(07) පහත මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
1. දුටුගැමුණු රජතුමා
2. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය
3. දෙවන ධර්ම සංගායනාව (
4. අත්තුපනායික ධර්ම පර්යාය